# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2149/27 - 2019 නොවැම්බර් මස 15 වැනි සිකුරාදා - 2019.11.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ලේකම්වරුන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය

ජනාධිපතිවරයා විසින් නියම කරන ලදුව 1979 අගෝස්තු මස 6 වැනි දින අංක 48/2 දරන *අති විශේෂ ගැසට් පත්‍රයෙහි* පළකරනු ලැබූ සහ කලින් කළ සංශෝධිත, ලේකම්වරුන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය, 2019.11.14 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි තවදුරටත් පහත උපලේඛනයෙහි සඳහන් ලෙසින් සංශෝධනය කිරීමට අතිගරු ජනාධිපතිතුමා නියම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

උදය ආර්. සෙනෙවිරත්න,
ජනාධිපති ලේකම්.

2019 නොවැම්බර් මස 14 වැනි දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

උපලේඛනය

එහි 9අ ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන නව ඡේදය ඇතුළත් කරනු ලබන අතර, එය එකී සංග්‍රහයේ 9ආ ඡේදය ලෙසින් බලපැවැත්විය යුතුය.

9ආ මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ 9අ ඡේදයෙහි සඳහන් විධිවිධාන, එකී ව්‍යවස්ථා සංග්‍රහයේ 1අ ඡේදය යටතේ ඇතුළත් කර ඇති අ. උපලේඛනයේ 05 යටතේ යළි සේවයේ නියුක්ත කරවනු ලැබූ නිලධාරීන්ට ද එලෙසින්ම අදාළ වන්නේය.


1A - G 31119 — 67 (2019/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*